# බළන්ගොඩ නගර සභාව

## 2025-07-08 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.07.08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේසල ටී. ජයසේන මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 09. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස්. චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ 2025-06-30 දිනැති විශේෂ මහා සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2025-06-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, 2025-06-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2025-06-30 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අංක 54/34, රාස්සගල පාර, බළන්ගොඩ ලිපිනයේ පදිංචි එම්.එම්.එම් නවාස් යන අය විසින් බළන්ගොඩ නගරයේ ළමා උද්‍යානය අසළ භූමිය මැණික් සතිපොළක් පැවැත්වීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් යොමු කර ඇති බව පවසන ලදී.

මේ පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ප්‍රකාශ කර සිටියේ මෙම ඉල්ලීම මැණික් වෙළඳ ව්‍යාපාරික සංගමයෙන් ඉල්ලීමක් වශයෙන් පැමිණිය යුතු බවත් ඒ අනුව සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සභාව සිදු කළ යුතු බවත්ය. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා තම අදහස් දක්වමින් සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියට අයත් පැරණි බස් නැවතුම්පොළ භූමිය වැනි සුදුසු ස්ථානයක මෙම ඉල්ලීම වෙනුවෙන් මැණික් පොළක් පැවැත්වීමට අවසර ලබා දිය යුතු බව පැවසීය. මේ අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙම ඉල්ලීම වෙනුවෙන් බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැළ පරිශ්‍රය යොදාගන්නේ නම් එම ප්‍රදේශයේ පාළු වී ඇති ව්‍යාපාර වලටද එය සුභදායක වනු ඇති බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, ඉදිරිපත් කර ඇති යෝජනාව ඉතාම කාලෝචිත බවත් මැණික් වෙළඳ සංගමය ගෙන්වා සාකච්ඡා කිරීම සුදුසු බවටත් පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා මැණික් වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කර මේ පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් 2025-07-08 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**04. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

අද දින ගරු සභාවට සංදේශ, පැමිණිලි, පෙත්සම්, ආයාචනා නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා නැගී සිටිමින් 2023.08.29 දිනැතිව දේගපිටිය ඇල්ලෙවත්ත ගමට පැමිණෙන මාර්ගය සංවර්ධනය කර දෙන ලෙස සාමාජිකයන් 15 දෙනෙකු අත්සන් කරමින් ලේකම්තුමිය වෙත යොමු කර ඇති ලිපිය අනුව එය මෙම සභාවට යොමු නොකරේ ඇයිදැයි විමසන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමා, ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය කල් දී ඇති ප්‍රශ්න යටතේ ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදුව මේ පිළිබඳව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා**

**05:01:01** අංක 06 කාර්පාර්ක් කඩ කාමරය අරුණි ගමගේට ලබාදුන් ආකාරය පිළිබඳ සවිස්තර වාර්තාවක්

ඉහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පහත පරිදි සවිස්තර වාර්තාව ඉදිරිපත් කරන ලදී.

- 2014 ජූලි සිට මෙම කඩ කාමරය ඩබ්.ඉන්දික පැතුම් යන අය විසින් රු.11,000 බැගින් මාසික කුලිය මත බදු ලබාගෙන එම කඩ කාමරය බදුකරු විසින් අරුණි ප්‍රදීප් ලක්මාලි යන අයට අතුරු බදු ලබා දී ඇත.
- එසේම ඩබ්.ඉන්දික පැතුම් යන අය විසින් මෙම කඩ කාමරය අරුණි ප්‍රදීප් ලක්මාලි යන අයට පවරන ලෙස ඉල්ලීමක් 2015.06.08 දින බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා වෙත යොමු කර ඇත.

- එම ඉල්ලීම අනුව අරුණි ප්‍රදීප් ලක්මාලි නමට කඩ කාමරය පවරා නොමැති බැවින් ඇයගේ නමට හැරවීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමන් වෙත 2017.10.02 දිනැතිව ඉල්ලීමක් සිදුකර ඇත.
- එම ලිපිය අනුව මෙම කඩ කාමරයේ බදු අයිතිය අරුණි ප්‍රදීප් ලක්මාලි මහත්මියගේ නමින් වෙනස් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමන් විසින් නියෝග කර ඇත.
- ඒ අනුව 2017.10.16 දිනැති තීරණ අංක බනස/17/10/16/12 යටතේ පා.පා.කො. 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව මෙම නම වෙනස් කිරීමේ කටයුතු සිදු කිරීමට අනුමත වී ඇත.
- ප.පා.කො. 01/2009 චක්‍රලේඛ අංක 1.11 ප්‍රකාරව අතුරු බදු දී ඇති අවස්ථාවක කඩ කාමරයේ බදු අයිතිය අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීම ප්‍රායෝගිකව නොවන බවට සභාව අදහස් කරන්නේ නම් සහ අතුරුබදුකරුට අයිතිය පවරන්නේ නම් කී මනී මුදලෙන් 25% ක මුදලක් සභාව බදුකරුගෙන් අයකරගත යුතු බව දන්වා ඇති අතර, මෙම කඩ කාමරය කී මනී කඩයක් නොවන අතර මාස 03 ගිවිසුම් ඇප තැන්පත් මත ටෙන්ඩර් කර දුන් කඩ කාමරයක් බැවින් එම කඩ කාමරය සම්බන්ධයෙන් 2017-10-23 දිනැති තීරණ අංක බනස/17/10/30/15 යටතේ ප.පා.කො. 01/2009 චක්‍රලේඛය අනුව මෙම කඩ කාමරය වෙනත් අයෙකුට නීත්‍යානුකූලව පැවරිය නොහැකිබව බනස/ආ/04/04/06 හා 2017.11.09 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමන් දැනුවත් කර ඇත.
- එම ලිපියට පිළිතුරු වශයෙන් 2017.11.16 දිනැති ආකා/5/3-271 ලිපිය මගින් පෙර ගෙවුම් කඩයක් සේ සලකා අවසන් තක්සේරුව මත 25% කීමනී මුදලක් මත අරුණි ප්‍රදීප් ලක්මාලි මහත්මියගේ නමින් වෙනස් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමන් විසින් නියෝග කර ඇත.
- මෙම කඩ කාමරය සම්බන්ධයෙන් 2017.11.27 දිනැති හා අංක ACLG 02 දරණ ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නියෝගය පිළිගන්නා ලෙස දන්වන ලදුව ,එම ලිපිය 2017.11.29 දිනැති තීරණ අංක බනස17/11/29/18 යටතේ අනුමත වී ඇත.
- මේ සම්බන්ධයෙන් 2017.12.15 දින බනස/ආ/04/04/06 යටතේ අරුණි ප්‍රදීප් ලක්මාලි යන අය දැනුවත් කර ඇත.
- ඒ අනුව 2017.12.20 දින තක්සේරු මුදල සංශෝධනය කරන ලෙස අරුණි ප්‍රදීප් ලක්මාලි විසින් ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් සිදු කර ඇත.
- ඒ අනුව උක්ත කඩ කාමරය අරුණි ප්‍රදීප් ලක්මාලි යන අය RT/RP/ 1449 හා 2015.01.16 දිනැති තක්සේරුව මත පෙර ගෙවුම් මුදල ගණනය කර බදු ලබා දෙන මෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ ආකා/5/3-271 හා 2017.12.27 දිනැති මගින් දැනුවත් කර ඇත.
- ඒ අනුව 2017.12.20 දින රිසිට් අංක 60550 යටතේ සහ 2017.12.29 දින රිසිට් අංක 60830 යටතේ පෙර ගෙවුම් මුදල් තැන්පත් කර ඇති අතර 2018.06.01 දින ගිවිසුම් අත්සන් කර ඇත.

ගරු නාගරික මන්ත්‍රී එච්.ජ්.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා තමන් මීන් පෙර මෙම සභාවෙන් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව සිදු කරන ලද තොරතුරු ඉල්ලීම ප්‍රශ්නාවලියක ස්වරූපයෙන් ඉදිරිපත් වූවා යැයි පවසා ප්‍රතික්ෂේප කළ බවත් , නම්කළ නිලධාරීගෙන් අභියාචනාවක් මඟින් තොරතුරු ලබාගත් බවත්, එහිදී ලද තොරතුරු අනුව මෙම කාර් පාර්ක් අංක 06 කඩ කාමරය ටෙන්ඩර් ක්‍රමවේදයෙන් බැහැරව අතුරු බදු ලබාගත් අය වෙතම ලබාදීම නීත්‍යානුකූල නොවන බවත් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු බවට යෝජනා කරන බවත් පවසන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ කල් දී ඇති ප්‍රශ්න යටතේ සභාපතිවරයා ලබාදෙනු ලබන පිළිතුරට තවත් එක් හරස් ප්‍රශ්නයක් පමණක් සභිකවරයෙකුට ඇසිය හැකි බවත්, නවක මන්ත්‍රීවරයෙකු ලෙස එම කරුණ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්, මෙම කඩ කාමරය ආණ්ඩුකාරතුමාගේ නියෝගය පරිදි අරුණි ප්‍රදීප් ලක්මාලි යන අය වෙත ලබා දී ඇති බවත්, එවැනි නීත්‍යානුකූල නොවන ක්‍රියාවක් සිදු වී ඇත්නම් ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන බවත්ය.

**05:01:02** අරුණි ගමගේ හට කඩ කාමරය ලබා දීමට පෙර බිල්පත්වලට ඇයගේ නම සඳහන් බිල්පත් 03 ඉදිරිපත් කරන්න.

ගරු සභාපතිතුමා මෙම ප්‍රශ්නයට පිළිතුරු යොමු කරමින් ඉල්ලීම් කර ඇති රිසිට්පත් ලබා දිය හැකි බව පවසන ලදී.

**05:01:03** 2018.05.22 වන දින මෙම කඩ කාමරය පිළිබඳ සාකච්ජා කරන ලද සභා වාර්තාව ඉදිරිපත් කරන්න. ඉල්ලීම් කර ඇති දිනයෙන් මහ සභාවක් පවත්වා නොමැති බවත් මේ සම්බන්ධව 2018.05.29 දිනැති සභා වාර්තාවේ තීරණ අංක 05:01:16 හි පිටපතක් ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

**05:01:04** කුඩා ගලි රථයේ සහ ගිනි නිවන රථයේ වර්තමාන තත්වය

සභාව සතු අංක 227-5020 දරණ කුඩා ගලි රථයේ හා ZA – 0228 ගිනි නිවන රථයේ වර්තමාන තත්වය පිළිබඳව කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීම පිණිස ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී. අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව කාරක සභාව මහ සභාව බවට ගරු සභාපතිතුමා යෝජනා කර ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා එම යෝජනාව ස්ථිර තරන ලදී.

**05:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**05:02:01** 2025.06.02 න් පසු සභාව විසින් 2025.07.01 දක්වා කරන ලද මිලදී ගැනීම් මොනවාද?

ඉල්ලුම් කර ඇති මිලදී ගැනීම් වලට අදාළව විස්තරය ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදුව පිටපත් ලබා ගත හැකි බව දැනුම් දෙන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා 2025.06.02 න් පසු සභාපතිවරයෙක් නොමැති කාලවකවානුවට අදාළව මිලදී ගැනීම් සිදුකිරීමට බලයක් තිබුනේදැයි විමසන ලදුව ගරු සභාපතිතුමා ඊට පිළිතුරු වශයෙන් එම කාලසීමාවට අදාළව ආයතනයේ සාමාන්‍ය කටයුතු හා මහජන සේවා බිඳනොවැටෙන පරිදි අවිච්ඡින්නව පවත්වා ගෙන යාම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් ලේකම් වෙත බලය පවරනු ලැබූ 2025.06.04 දිනැති හා CLG/AD01/8/9/පොදු අංක දරණ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**05:02:02** 2025.06.02 න් පසු 2025.07.01 දක්වා සභාව විසින් කරන ලද ගෙවීම් මොනවාද?මුදල් ගෙවූ කාරණය,ගෙවීම් කළ දිනය,ගෙවූ මුදල,චෙක්පත හෝ වවුචර් තොරතුරු

ඉල්ලුම් කර ඇති ගෙවීම් වලට අදාළව විස්තරය ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදුව පිටපත් ලබා ගත හැකි බව දැනුම් දෙන ලදී.

**05:03 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

**05:03:01** 2025 වර්ෂයේ මුල් මාස 06 හි ගලි බවුසර් වලින් ලැබුණු ආදායම හා වියදම

2025.01.01 සිට 2025.06.30 දක්වා ගලි බවුසර් සේවාව සැපයීමේ ආදායම රු.2,277,000.00 ක් බවත් වියදම රු.1,559,960.20 ක් බවත් ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙන ලදී.

**05:03:02** 2025 වර්ෂයේ මුල් මාස 06 හි ජේ.සී.බී.යන්ත්‍රයේ ලැබුණු ආදායම හා වියදම

2025.01.01 සිට 2025.06.30 දක්වා ජේ.සී.බී යන්ත්‍රය කුලියට ලබා දීමේ ආදායම රු.169,677.00ක් බවත් වියදම රු.712,026.00ක් බවත් ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙන ලදී.

**05:03:03** 2025 වර්ෂයේ මුල් මාස 06 හි කොම්පෝස්ට් අංගනයෙහි ආදායම සහ වියදම

2025.01.01 සිට 2025.06.30 දක්වා කොම්පෝස්ට් අංගනයෙහි ආදායම රු.1,158,569.00 බවත් වියදම රු.10,495,822.46 ක් බවත් ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙන ලදී.

**05:03:01** 2025 වර්ෂයේ මුල් මාස 06 හි ක්‍රීඩාපිටියෙන් ලැබුණු ආදායම සහ වියදම

2025.01.01 සිට 2025.06.30 දක්වා ක්‍රීඩා පිටිය කුලියට ලබා දීමේ ආදායම රු.232,000 ක් බවත් වියදම රු.39,262.00 ක් බවත් ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති කේ. පී.පේමදාස මැතිතුමා**

**06:01:01 කාරක සභා පත්කිරීම**

**06:01:01:01 මුදල් කාරක සභාව පත්කිරීම හා බලතල පැවරීම.**

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු 159 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම ආඥා පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්න යෝජනා කරමි. එසේම එකී මුදල් කාරක සභාව,

1.ගරු සභාපති කේ.ජී පේමදාස මැතිතුමා

2.ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා

3.ගරු නාගරික මන්ත්‍රි ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා

4.ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

5.ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

6.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා

7.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා

8..ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා යන සභිකයන් 08 දෙනෙකුගෙන් යුත් කාරක සභාවක් විය යුතුය යන්නත්,

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 39 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් හෝ මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයන් සමඟ ඇතිකර ගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම් වන විට හා ගිවිසුම්ගත ඇස්තමේන්තු වටිනාකම රුපියල් ලක්ෂයකට (රු.100,000.00) වැඩි වූත් රුපියල් හත් ලක්ෂ පනස් දහස

(රු.750,000.00) නොඉක්මවන පරිදිත් වන මූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගිවිසුම්ගත වීම සඳහා බලය දීම හා ඊට අදාළ ගිවිසුම් අනුමත කිරීම සඳහා වන බලතල ඉහත කී පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පැවරීමටත් ගරු සභාපතිතුමා සභාවට යෝජනා ලදී.

**ඉහත කී උපලේඛනය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදමක් වන විටදී රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් හත් ලක්ෂ පනස් දහස (රු. 750,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් හත් ලක්ෂ පනස් දහස (රු. 750,000.00) දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, කර්මාන්ත කාරක සභාව, පුස්තකාල හා උපදේශන කාරක සභාව , පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව , සංවර්ධන උපදේශන කාරක සභාව යන කාරක සභා වලින් නිර්දේශ කරනු ලබන රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් හත් ලක්ෂ පනස් දහස (රු. 750,000.00) දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 100,000.00 සිට රු. 750,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතීන් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම වේ.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මුදල් කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බවට ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ප්‍රකාශ කරන ලදුව එම ඉල්ලා අස්වීම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මුදල් කාරක සභාවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පවසා සිටියේ සභා රැස්වීම් පැවැත්වීමේ අතුරු ව්‍යවස්ථාවේ 44(1) අනුව කාරක සභා සඳහා සාමාජිකයන් සභාව විසින් පත් කළ යුතු බවත් සභාපතිවරයාට පත් කළ නොහැකි බවත්ය. ඊට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටියේ සභාපතිවරයාට කාරක සභා සඳහා සාමාජිකත්වය වෙනුවෙන් නම් යෝජනා කළ හැකි බවත් ඒ අනුව ඉහත යෝජනාව සිදු කර ඇති බවත් අවශ්‍ය සංශෝධන සිදු කර ගැනීමට සභිකවරුන්ට අවස්ථාව ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා නැගී සිටිමින් අද දින සභාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා නොමැති බැවින් එතුමාගේ මුදල් කාරක සභාවේ සාමාජිකත්වය වෙනුවට ගරු

නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සුදුසු බවට යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය තමන් මුදල් කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බවත් ඒ සඳහා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන බවත් පවසන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මුදල් කාරක සභාවට පැවරිය යුතු වියදම් සීමාව රු.ලක්ෂ 10 ක් විය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා යෝජනා කරන ලදී. අනතුරුව එකී වියදම් සීමාව රුපියල් ලක්ෂ 7.5 ක් විය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් රුපියල් ලක්ෂ 7.5 ක් විය යුතු බවට කරනු ලැබූ යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව වියදම් සීමාව සහ මුදල් කාරක සභාවේ කර්තව්‍ය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මහ සභාව කාරක සභාවක් කළ යුතු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

කාරක සභාවේ සාකච්ඡා කරගත් කරුණු අනුව මුදල් කාරක සභාව වෙත පැවරිය යුතු වියදම් සීමාව රු.ලක්ෂ 5 ක් විය යුතු බවට ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඉන්පසු එම වියදම් සීමාව පිළිබඳ සභාවේ විවිධ මත පළවූ බැවින් වියදම් සීමාව රුපියල් ලක්ෂ 05 ක් සඳහා වන යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යා යුතු බවට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව මුදල් කාරක සභාව වෙත බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදමක් වන විටදී රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීමේ බලය ලබා දීමේ යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 07 දෙනෙකු ද, එනම්,

01. ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් 05 දෙනෙකුද, එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
05. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

ඒ සඳහා ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි සභිකවරුන් 03 දෙනෙකුද,එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ලෙස සභිකවරුන් ඡන්දය ප්‍රකාශ කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා සභාවට නොපැමිණි සභිකයා වේ.

පැවති විවෘත ඡන්ද විමසීමට අනුව මුදල් කාරක සභාව වෙත, බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදමක් වන විටදී රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම යෝජනාවට පක්ෂව ඡන්ද 07 ක් ද විපක්ෂව ඡන්ද 05 ක් ද ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි 03 ක්ද වශයෙන් වැඩි ඡන්ද 02 කින් සභා සම්මත විය.

ඒ අනුව 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමග කියවිය යුතු 159 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල අතරින් මෙහි පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන බලතල එම ආඥා පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්නත් , එකී මුදල් කාරක සභාව

1.ගරු සභාපති කේ.ජී පේමදාස මැතිතුමා
2.ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා
3.ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
7.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
8..ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා යන සභිකයන් 08 දෙනෙකුගෙන් යුත් කාරක සභාවක් විය යුතුය යන්නත්,

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 39 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාව විසින් හෝ මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයන් සමග ඇතිකර ගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම් වන විට හා ගිවිසුම්ගත ඇස්තමේන්තු වටිනාකම රුපියල් ලක්ෂයකට (රු.100,000.00) වැඩි වූත් රුපියල් ලක්ෂ පහ (රු.500,000.00) නොඉක්මවන පරිදිත් වන මූල්‍ය වටිනාකමක් වෙනුවෙන් ගිවිසුම්ගත වීම සඳහා බලය දීම හා ඊට අදාළ ගිවිසුම්

අනුමත කිරීම සඳහා වන බලතල ඉහත කී පනතේ 29 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව බළන්ගොඩ නගර සභාවේ මුදල් කාරක සභාව වෙත පැවරීමටත්

**ඉහත කී උපලේඛනය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව ප්‍රාග්ධන හෝ පුනරාවර්තන වියදමක් වන විටදී රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, කර්මාන්ත කාරක සභාව, පුස්තකාල හා උපදේශන කාරක සභාව , පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව , සංවර්ධන උපදේශන කාරක සභාව යන කාරක සභා වලින් නිර්දේශ කරනු ලබන රුපියල් ලක්ෂයේ (රු.100,000.00) සිට රුපියල් ලක්ෂ පහ (රු. 500,000.00) දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 100,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම, අවස්ථානුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම, නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරිම හා ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම වේ.

වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා මැතිතුමා විසින් එකී සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**06:01:01:02 කර්මාන්ත කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, අදාළ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කාරක සභාවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, සංවර්ධන කටයුතු සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

1.ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
2.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
3.ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා
7.ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
8.ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
9.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

10.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 10 දෙනෙකුගෙන් යුත් කර්මාන්ත කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කර්මාන්ත කාරක සභාවේ සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පසුගිය මහ සභා රැස්වීම් වාරයේදී සාකච්ඡා කළ පරිදි කර්මාන්ත කාරක සභාව සඳහා බළන්ගොඩ නගර කොට්ඨාශ 10න් සභිකයන් 10 දෙනෙකු නියෝජනය කිරීම සුදුසු බවත්, එබැවින් වෙනත් යෝජනා අවශ්‍ය නොවන බව අදහස් කරන බවත් ඉහත ගරු සභාපතිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් පවසන ලදී.

කර්මාන්ත කාරක සභාවේ සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.පසුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය කර්මාන්ත කාරක සභා සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බව පවසන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, අදාළ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කාරක සභාවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, සංවර්ධන කටයුතු සම්බන්ධ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ කර්මාන්ත කාරක සභාව පිහිටුවීමටත් එකී කාරක සභාව,

1.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා (කාරක සභාවේ සභාපති)
2.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
3.ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා
7.ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
8.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
9.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
10.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 10 දෙනාගෙන් සමන්විත විය යුතු බවටත් වන සංශෝධිත යෝජනාව නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා

කරන ලදුව, ඉහත සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:01:03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කාරක සභාවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා,

1.ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
2.ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
3.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ. එස්. චන්දන මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
7.ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
8.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා
9.ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
10.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 10 දෙනෙකුගෙන්ද ප්‍රජා නියෝජනයෙන්

11. වෛද්‍ය සුජිත් ප්‍රියන්ත මහතා
12. විශ්‍රාමික පොලිස් පරීක්ෂක එම්.වී.ධර්මරත්න මහතා
13. නීතීඥ දිනෙත් දයාරත්න මහතා
14. නීතීඥ ශාන්තිලේඛා මහත්මිය
15. අමිල රුවන්ත අදිකාරම් මහතා
16. වෛද්‍ය කේ.එස්.ඩී.පී.කණ්ඩුල මහත්මිය
17. පී.එච්.ගර්ලි මානෙල් රුදිගු මිය
18. උපාලි තිස්සානන්ද මහතා
19. වයි.පී.කුමාරසිංහ මහතා
20 ජී.ජයතිස්ස මහතා යන පුරවැසියන් 10 දෙනෙකුගෙන්ද යුත් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ජී.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ප්‍රකාශ කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී එන්.ජී.එස් චන්දන මැතිතුමා විසින් එකී ඉල්ලා අස්වීම ස්ථිර කිරීම සහ ඒ වෙනුවට ගරු සභාපති කේ.ජී ප්‍රේමදාස මැතිතුමා සුදුසු බවට යෝජනා කිරීම සිදු කිරීමත් එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා විසින් ස්ථිර කිරීමත් සිදු කරන ලදී.

තමන් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා පවසන ලදුව එකී ඉල්ලා අස්වීම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එකී පුරප්පාඩු වන සාමාජිකත්වය වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එන්.ජී සී. චන්දන මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව සභාපතිතුමා ඉදිරිපත් කර ඇති පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා සංශෝධන ඉදිරිපත් කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසීය.ඒ අනුව ගරු සභාපතිතුමා විසින් යෝජනා කර ඇති ප්‍රජා නියෝජන සමාජිකයන් පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණයන් යොදා ගැනීම සුදුසු බවත් ඒ අනුව සබරගමුව විශ්ව විද්‍යාලයේ කසළ කළමණාකරණය පිළිබඳ ප්‍රවීණයෙක් වන ආචාර්ය සම්පත් වාසල මහතා ප්‍රජා නියෝජනය වෙනුවෙන් යෝජනා කරන බව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා යෝජනා කරන ලදුව ඉහත යෝජනාවේ සඳහන් පී.එච්.ගර්ලි මානෙල් රූදිගු මිය වෙනුවට එම මහතා සාමාජිකත්වය සඳහා සුදුසු බවට පවසමින් ගරු සභාපතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා ආනන්ද අර්ජුන කුමාර මහතා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය යෝජනා කරන ලද අතර එම මහතා ඉහත යෝජනාවේ සඳහන් උපාලී තිස්සානන්ද මහතා වෙනුවට යොදා ගැනීම සුදුසු බවට පවසමින් ගරු සභාපතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

තවද ඉහත කාරක සභාවේ ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා හිටපු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මහතා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා යෝජනා කරන ලද අතර එම මහතා ඉහත යෝජනාවේ සඳහන් වයි.පී.කුමාරසිංහ මහතා වෙනුවට යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලද අතර එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව බලන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ මුදල් කාරක සභාවට හා සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් ඉටු කිරීම යන කරුණු උදෙසා වූ බලන්ගොඩ නගර සභාවේ පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාරක සභාවේ සාමාජිකයන් ලෙස,

1. ගරු සභාපති කේ.ජී පේමදාස මැතිතුමා
2.ගරු නාගරික මන්ත්‍රි ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා (කාරක සභාවේ සභාපති)
3.ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රි එන්.ජ්.එස් චන්දන මැතිතුමා
7.ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
8.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා
9.ගරු නාගරික මන්ත්‍රි ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
10.ගරු නාගරික මන්ත්‍රි එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 10 දෙනොද, ප්‍රජා නියෝජනයෙන්

11. වෛද්‍ය සුජිත් ප්‍රියන්ත මහතා
12. විශ්‍රාමික පොලිස් පරීක්ෂක එම්.වී.ධර්මරත්න මහතා
13. නීතිඥ දිනෙත් දයාරත්න මහතා
14. නීතිඥ ශාන්තිලේඛා මහත්මිය
15. අමිල රුවන්ත අදිකාරම් මහතා
16. වෛද්‍ය කේ.එස්.ඩී.පී.කණ්ඩුල මහත්මිය
17. ආචාර්ය සම්පත් වාසල මහතා
18. ආනන්ද අර්ජුන කුමාර මහතා
19. හිටපු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මහතා
20 ජී.ජයතිස්ස මහතා යන පුරවැසියන් 10 දෙනොද පත් කිරීම සඳහා වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව එකී සංශෝධිත යෝජනාව ගරු උප සභාපති පේෂල ටී. ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:01:04 පුස්තකාල උපදේශන කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කාරක සභාවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

01.ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
02.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
03.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
04.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
05.ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
06.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 06 දෙනෙකුගෙන්ද,
ප්‍රජා සහභාගීත්වයෙන්,

07. මහාචාර්ය මනෝජ් ආරියරත්න මහතා
08. නීතීඥ ශාන්තිලේඛා මහත්මිය
09. සරත් ගුණවර්ධන මහතා
10. ඩබ්.එස්.ඩී.යූ.බණ්ඩාර මහතා
11. ආර්.ජෙයරාජන් මහතා
12. ඩී.ඒ.දයාවංශ මහතා යන පුරවැසියන් 06 දෙනෙකුගෙන්ද යුත් පුස්තකාල උපදේශන කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව පුස්තකාල උපදේශන කාරක සභාව සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ප්‍රකාශ කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එකී ඉල්ලා අස්වීම ස්ථිර කිරීම සහ ඒ වෙනුවට ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමා සුදුසු බවට යෝජනා කිරීමත් එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමත් සිදු කරන ලදී.

පුස්තකාල උපදේශන කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ප්‍රකාශ කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා එකී ඉල්ලා අස්වීම ස්ථිර කරන ලදී.

තමන් පසුගිය සභාවන් වලදී පුස්තකාල උපදේශන කාරක සභාවන් ක්‍රියාකාරීව තම දායකත්වය ලබා දුන් බවත් මේ අවස්ථාවේ නවක මන්ත්‍රීවරුන් වෙත එම අවස්ථාව ලබා දිය යුතු බැවින් පුස්තකාල උපදේශන කාරක සභාවෙන් ඉවත් වූ බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා සාමාජිකත්වය වෙනුවෙන් යෝජනා කරන බවත් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පවසන ලදුව එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පුස්තකාල උපදේශන කාරක සභාවේ සභාපති ලෙස ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ සී. චන්දන මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

පුස්තකාල උපදේශන කාරක සභාවේ ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා ර/විද්‍යාලෝක මහ විද්‍යාලයේ හිටපු විදුහල්පති ජයතිලක මහතා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලද අතර එම මහතා ඉහත යෝජනාවේ සඳහන් සරත් ගුණවර්ධන මහතා ඉවත් කර ඒ වෙනුවට යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදුව එම යෝජනාව ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා ස්ථිර කරන ලදී.

පුස්තකාල උපදේශන කාරක සභාවේ තව දුරටත් ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා සංශෝධන ලෙස මින් පෙර එකී කාරක සභාවන්හි ක්‍රියාකාරී දායකත්වය සැපයූ සබරගමුව විශ්ව විද්‍යාලයේ පුස්තකාලාධිපති සේවයේ නියුතු නෙයිසූරී මහත්මිය සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා යෝජනා කරන ලද අතර එම මහත්මිය, ඉහත යෝජනාවේ සඳහන් නීතීඥ ශාන්තිලේඛා මහත්මිය ඉවත් කර ඒ වෙනුවට යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදුව එම යෝජනාව සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබා දීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කාරක සභාවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම, පුස්තකාල සාමාජික ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර නිර්දේශ ඉදිරිපත් කිරීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ බළන්ගොඩ නගර සභා පුස්තකාල උපදේශන කාරක සභාවේ සාමාජිකයන් ලෙස,

01.ගරු උප සභාපති පේෂල ටී.ජයසේන මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රි එන්.ඒ.එස් චන්දන මැතිතුමා (කාරක සභාවේ සභාපති)

03.ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා

04.ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

05.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා

06.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා යන නම් සඳහන් සභිකයන් 06 දෙනාද, ප්‍රජා සහභාගීත්වයෙන්,

07. මහාචාර්ය මනෝජ් ආරියරත්න මහතා

08. පුස්තකාලාධිපති නෙයිසූරී මහත්මිය

09. හිටපු විදුහල්පති ජයතිලක මහතා

10. ඩබ්.එස්.ඩී.යු.බණ්ඩාර මහතා

11. ආර්.ජෙයරාජන් මහතා

12. ඩී.ඒ.දයාවංශ මහතා යන පුරවැසියන් 06 දෙනාද පත් කිරීම සඳහා වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව එකී සංශෝධිත යෝජනාව ගරු ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:01:05 සංවර්ධන උපදේශන කාරක සභාව පත්කිරීම සහ බලතල පැවරීම.**

බලන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

1.ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා
2.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
3.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
6.ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය යන නම් සඳහන් සභිකයන් 06 දෙනෙකුගෙන්ද ප්‍රජා නියෝජනයෙන්

7. මහාචාර්ය මනෝජ් ආරියරත්න මහතා
8. මහාචාර්ය එච්.එම්.එස් ප්‍රියනාත් මහතා
9. මහාචාර්ය ප්‍රභාත් රණතුංග මහතා
10. මහජන බැංකු හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පී.රාජපක්ෂ මහතා
11. විශ්‍රාමික තක්සේරු නිලධාරී එම්.එන්.එම්.කුලරත්න මහතා
12. විශ්‍රාමික පොලිස් පරීක්ෂක එම්.වී ධර්මරත්න මහතා යන පුරවැසියන් 06 දෙනෙකුගෙන්ද යුත් සංවර්ධන උපදේශන කාරක සභාව පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංවර්ධන උපදේශන සභාවේ සාමාජිකත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා ඉල්ලා අස්වීමටත් ඒ වෙනුවට ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පත්කිරීම සුදුසු බවටත් යෝජනා කරන ලද අතර එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කිරීම සිදු කරන ලදී.

පසුව තමන් කාරක සභාවන් කිහිපයකම සාමාජිකත්වය දරන බැවින් ඉහත යෝජනාවෙන් ඉල්ලා අස්වන බව එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

සංවර්ධන උපදේශන කාරක සභාවේ සභාපති ලෙස ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

සංවර්ධන උපදේශන කාරක සභාවේ ප්‍රජා නියෝජනයෙන් වන සාමාජිකත්වය සඳහා සබරගමුව විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා අධ්‍යක්ෂක ඩබ්.ඒ ලලිත් රෝහණ මහතා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කරන ලද අතර ඉහත යෝජනාවේ සඳහන් විශ්‍රාමික පොලිස් පරීක්ෂක එම්.වී ධර්මරත්න මහතා ඉවත් කර ඒ වෙනුවට යොදා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදුව එම යෝජනාව ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා වූ බළන්ගොඩ නගර සභා සංවර්ධන උපදේශන කාරක සභාවේ සාමාජිකයන් ලෙස,

1.ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා (කාරක සභාවේ සභාපති)
2.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
3.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
4.ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
5.ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය යන නම් සඳහන් සභිකයන් 05 දෙනෙකුගෙන්ද ප්‍රජා නියෝජනයෙන්

7. මහාචාර්ය මනෝජ් ආරියරත්න මහතා
8. මහාචාර්ය එච්.එම්.එස් ප්‍රියනාත් මහතා
9. මහාචාර්ය ප්‍රභාත් රණතුංග මහතා
10. මහජන බැංකු හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පී.රාජපක්ෂ මහතා
11. විශ්‍රාමික තක්සේරු නිලධාරී එම්.එන්.එම්.කුලරත්න මහතා
12. සබරගමුව විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා අධ්‍යක්ෂක ඩබ්.ඒ ලලිත් රෝහණ මහතා යන පුරවැසියන් 06 දෙනාද දෙනොද පත් කිරීම සඳහා වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට යෝජනා කරන ලදුව එකී සංශෝධිත යෝජනාව ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:01:06 කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව පත් කිරීම සහ බලතල පැවරීම.**

රුපියල් 100,000.00 දක්වා වූ කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස බළන්ගොඩ නගර සභාවේ,

1. ලේකම්
2. ගණකාධිකාරී
3. ප්‍රධාන කළමනාකරණ සහකාර
4. වැඩ අධිකාරී
5. ආදායම් අංශ ප්‍රධානී
6. පුස්තකාලාධිපති
7. මහජන සෞඛ්‍ය පරීක්ෂක යන තනතුරු දරන නිලධාරීන් පත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ බැවින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:02 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 224 වගන්තිය යටතේ වන අධිකාරය පිරිනැමීම.**

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 36 වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 159 වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බළන්ගොඩ නගර සභාවේ අරමුදලින් කළ හැකි වියදමකට අදාළව, අදාළ වියදම රුපියල් ලක්ෂය (රු 100,000.00) නොඉක්මවන ප්‍රාග්ධන වියදම් සම්බන්ධව වන විටදී හා අදාළ වියදම රුපියල් ලක්ෂය (රු 100,000.00) නොඉක්මවන පුනරාවර්තන වියදම් සම්බන්ධව වන විටදී වියදමට අදාළව බලය දීම සඳහා බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 224 වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාවේ ලේකම් වෙත අධිකාරය පැවරිය යුතු බවටත් තවද එකී අධිකාරය මෙම යෝජනාවට අදාළ සභාවේ සභා සම්මුතිය බළන්ගොඩ නගර සභාව විසින් පරිච්ජින්න කරන තාක් වලංගුව බලපැවැත්විය යුතු බවටත් යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.ඒ අනුව යෝජනාව ස්ථිර නොවූ බැවින් මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය දැයි ගරු සභාපතිතුමන් විමසන ලදුව ඒ අනුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.අනතුරුව ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:03 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත බලය පැවරීම.**

මහජන සෞඛ්‍ය ක්‍රියාත්මක කිරීමට අදාළ පොදු අධිකාරිය බළන්ගොඩ නගර සභාව වන හෙයින්ද එම අධිකාරි බලය ක්‍රියාත්මක කිරීමෙහිලා කටයුතු කිරීමේදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විමසා කටයුතු කලයුතු හෙයින්ද විවිධ ආඥා පනත් හා වෙනත් යම් ලිඛිත නීති යටතේ සභාවට හා සභාපතිවරයා වෙත පිරිනැමී ඇති බලතල පවරා දීම සභාවේ යම් නිලධාරීයෙකු වෙත පමණක් සිදු කලහැකි තත්වයද සැලකිල්ලට ගනිමින් බළන්ගොඩ නගර

සභා බල ප්‍රදේශයට අදාළ වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා ඔහු යටතේ කටයුතු කරනු ලබන බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට අයත්ව සේවයේ යොදවා ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහා කාර්යය මණ්ඩලය සේ සලකා කටයුතු කල යුතුය යන්න යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.ඒ අනුව යෝජනාවේ සඳහන් බලතල පැවරීම පිළිබඳ පිළිබඳව පැහැදිලි කිරීමක් සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අදාළ බලතල පැවරීම පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී. අනතුරුව ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:04 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 126 වන වගන්තිය යටතේ වන බලය පැවරීම.**

255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 103 වගන්තිය යටතේ සඳහන් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍යයට අදාළව ප්‍රරෝහණය හා ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා නගර සභා ආඥා පනතේ සඳහන් විධිවිධානයන්ට හෝ වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව හෝ නොසලකාහැර කටයුතු කිරීමෙන් කිසියම් පීඩාවක් නැතහොත් කරදරයක් වන ආකාරයට කටයුතු යෙදී තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා දවසේ සාධාරණ වේලාවක් තුළ කිසියම් පරිශ්‍රයකට ඇතුල් වී පරීක්ෂා කිරීම සඳහා වන කාර්යය මෙහි පහත උපලේඛනයේ සඳහන් සභාවේ නිලධාරීන් වෙත එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියා කිරීමට හැකි වන පරිදි 255 වන අධිකාරය නගර සභා ආඥා පනතේ 224 වගන්තිය සමඟ කියවිය යුතු 126 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව සභාපතිගේ පොදු පරිපාලනයට යටත්ව අධිකාරය පිරිනැමිය යුතු බවට යෝජනා කරමි.

ඉහත කී උපලේඛනය,

01. කාර්මික නිලධාරී I-එස්.එම්.සී.එස්.කේ.අබේසිරිවර්ධන මහතා
02. කාර්මික නිලධාරී II- එම්.එන්.පී.මුණසිංහ මහතා
03. මහජන සෞඛ්‍ය පරීක්ෂක ඒ.වී.ඒ.පී.ගුණරත්න මහතා
04. මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.එච්.ජී.සංජීව මහතා
05. මහජන සෞඛ්‍ය පරීක්ෂක ජී.සී.එම්.සෝමතුංග මහතා
06. මහජන සෞඛ්‍ය පරීක්ෂක කේ.ඩබ්.ඒ.එන්.අයි.වීරසේකර මහතා
07. මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.එස්.ගමගේ මහතා
08. මහජන සෞඛ්‍ය පරීක්ෂක එල්.එස්.පී ආරියරත්න මහතා

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06꞉01꞉05** බළන්ගොඩ නගර සභාව සතු තානායම මිදුල සහ බැම්ම සකස් කිරීම.

**06꞉01꞉05꞉01** බළන්ගොඩ නගර සභාව සතු තානායම මිදුල විධිමත්ව සකස් කිරීම සඳහා වන රු. 2,938,000 ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

**06꞉01꞉05꞉02** තානායම බැම්ම සකස් කිරීම සඳහා වන රු.2,062,000 ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මහ සභා රැස්වීම් න්‍යාය පත්‍රයට අනුව මේ දක්වා ඉදිරිපත් වන යෝජනා සඳහා අරමුදල් සපයා ගන්නා ආකාරය සහ නව අයවැය ලේඛනයක් ඉදිරිපත් කරනවාද යන්නත් එසේ නොමැතිනම් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනවාද යන්නත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ගරු සභාපතිතුමාගෙන් විමසීම් කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් අයවැය ඉදිරිපත් කිරීම සහ ඉහත යෝජනා අංක 06:01:05 සඳහා අරමුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳව ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කර ගැනීම සඳහාත් ඉදිරිපත් කර ඇති තානායම අලුත්වැඩියා කිරීම් වලට අදාළ ඇස්තමේන්තු පිළිබඳව කාර්මික නිලධාරීගෙන් කරුණු විමසීම සඳහාත් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලද අතර පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන බවත්, තානායමේ අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය කඩිනමින් අවසන් කර ටෙන්ඩර් කිරීම කළ යුතු බවත් ගරු සභාපතිතුමා සභාව දැනුවත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06꞉01꞉06** බළන්ගොඩ නගරය තුළ තුරු උයන ආසන්නයේ හෝ සුදුසු ස්ථානයක හෙළ බොජුන්හලක් ඉදිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, මීට පෙර මෙම ව්‍යාපෘතිය සඳහ සැලසුම් සකස් කර තිබූ බවත් එම සැලසුම නාගරික සංවර්ධන අධිකාරිය අනුමත කළ බවත් ඒ අනුව එම ව්‍යාපෘති වාර්තාවද සැලකිල්ලට ගන්නා ලෙසත් පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06꞉01꞉07** Clean Sri Lanka වැඩසටහන යටතේ බළන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීම දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන 10 සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා ඉහත යෝජනාව බලන්ගොඩ නගරය තුළ අනිවාර්යෙන්ම සිදුකළ යුතු සංවර්ධන වැඩසටහනක් බැවින්ද මීට අදාළ ප්‍රතිපාදන පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලැබෙන බවද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:08** Clean Sri Lanka වැඩසටහන යටතේ නව ගලි ප්‍රතිකාරක පද්ධතිය ස්ථාපිත කිරිම සඳහා වන දළ ඇස්තමේන්තුව රුපියල් මිලියන 30 සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඉදිකිරීමට යෝජිත බළන්ගොඩ බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතියේ ගලි ප්‍රතිකාරක පද්ධතිය ස්ථාපිත කිරීම හා ඒ සම්බන්ධව නිරීක්ෂණය කළ ගලි ප්‍රතිකාරක පද්ධතියේ තාක්ෂණික කරුණු පිළිබඳව කාර්මික නිලධාරී මඟින් කරුණු විමසීමක් සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව මේ සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා ඉහත යෝජනාව සඳහාද අදාළ ප්‍රතිපාදන පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ලැබෙන බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:09** මුගුණමලේ සිට බළන්ගොඩ බස්නැවතුම්පල දක්වා ඇති මාර්ගයේ අබලන් වී ඇති පාලම අලුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති පේසල ටී. ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා මෙම පාලම කඩිනමින් අලුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින බවත් අවදානම් තත්වයක් පවතින බවත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:10** 2025 ජූනි මස විදුලි බිල්පත් රු. 15899.85 ක් සහ ජල බිල්පත් රු.173055.66 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, ඉහත යෝජනාවේ ආවරණ අනුමැතිය ලබා ගෙන ඇති ගෙවීම් වලට වඩා ගෙවීම් ප්‍රමාණයක් තමන් විසින් ඉදිරිපත් කර ඇති කල් දී ඇති ප්‍රශ්න යටතේ ලද පිළිතුරු ලයිස්තුවේ සඳහන් බවත් එම ගෙවීම් මොනවාද යන්න පිළිබඳවත් ප්‍රශ්න කරන ලදී.

ඒ අනුව එම ගෙවීම් පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අනතුරුව කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාවත්යෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:11** 2025 ජූනි මස විදුලි බිල්පත් රු. 10,120.68 ක් සහ දුරකථන බිල්පත් රු.3,579.29 ක් ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:12** 2025-05-30 දිනැති අංක 2468/63 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සභිකවරුන්ට ගෙවිය යුතු සංයුක්ත දීමනාව රු.8000/- ක සීමාවකට යටත්ව ගෙවීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ13** සභා කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත සභා සම්මත කරගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ14** බළන්ගොඩ නගර සභාව සතු තානායම වර්ෂ 05 ක කාලයකට බදු දීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ15** 2025-06-16 දින සිට 2025-06-30 දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් ටෙන්ඩර්කරු වෙත රු.525,000.00 ක් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ජේ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් නගරයේ කසළ ඉවත් කිරීම සඳහා සභාවෙන් ට්‍රැක්ටර් රථ හා කම්කරුවන් යනාදිය සපයා දී තිබියදීත් ඉහත මුදල අනුව සභාව විසින් එක් දිනකට රු.35,000 ක් පමණ වැය දරන බවත් ඒ අනුව එම මුදල කෙතරම් සාධාරණද යන්නත් පැවසීය.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ පිළිබඳව පැහැදිලි කිරීමට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජේ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා සුදුසු බවයි.ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජේ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මීට පෙර සෘජු ශ්‍රමය භාවිතයෙන් කසළ කළමණාකරණ කටයුතු සිදු කිරීම සභාව මඟින් සිදු කිරීම කළ බවත්,එම කාලයේදීද මෙවැනි මුදලක් වැය කිරීමට සිදු වූ බවත්, ටෙන්ඩර් කර ලබා දීමේදී ටෙන්ඩර්කරු යම් කිසි ලාභයක්ද බලාපොරොත්තු වන බැවින් ඉහත මුදල වැය කිරීමට සිදු වනු ඇති බවත්, ගිවිසුම් ප්‍රකාරව සේවකයන් 18 දෙනෙකු පමණ මේ සඳහා යොදවන බවද සියලු නඩත්තු වියදම් ටෙන්ඩර්කරු දරණ බවද, ඇතැම් මාර්ගවල ට්‍රැක්ටර් රථ ධාවනය නොවීම වැනි ගැටළු පිළිබඳ සාකච්ඡා කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පුවක්ගහමුල්ල මාර්ගයේද ජනතාව හුරු වී ඇති පරිදි ට්‍රැක්ටර් හෝන් නිසි පරිදි ක්‍රියා නොකරන බවත්, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව පිටුපස ඉඩමේද කුණු කසළ විශාල ප්‍රමාණයක් පවතින බවත් එම ඉඩම සුද්ද පවිත්‍ර කරන ලෙස නිවේදනය කළ යුතු බවත්, එසේ නොමැතිනම් සභාව මඟින් පිරිසිදු කිරීම් සිදු කර ඉඩම තුළ ඉදිකිරීම් සිදු කරන තුරු රථ වාහන නැවතුම්පළකට පවත්වා ගෙන යාම සුදුසු බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසුයේ උඩකන්ද මාර්ගයේ බෑවුම සහිත කොටසේ ට්‍රැක්ටර් රථ ධාවනය සිදු කිරීම දුෂ්කර බැවින් අත් කරත්ත හෝ යොදවා කුණු එකතු කිරීම සිදු කරන්නේනම් එය ඉතා වටිනා බවයි.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ ට්‍රැක්ටර් රථ හෝන් නිසි පරිදි සකසා ගන්නා ලෙස රියදුරන් වෙත උපදෙස් ලබා දී ඇති බවත්, ට්‍රැක්ටර් රථ ධාවනය දුෂ්කර මාර්ගවල යෙදවීම සඳහා ඩීසල් ත්‍රිරෝද රථයක් හෝ සුදුසු වාහනයක් මිලදී ගැනීමට 2015 දී පමණ පැවති සභාවන් වලදී ගරු නාගරික මන්ත්‍රී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමියද යෝජනා ඉදිරිපත් කළ බවත් එවකට පැවති පාලනයන් මඟින් එම ඉල්ලීම් මේ වන තෙක්ම සිදු නොවී ඇති බවත් ඒ අනුව මෙම ඉල්ලීම සඳහා කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කළ යුතු බවත් ගරු ආණ්ඩුකාරතුමිය හා ජනාධිපතිතුමා සම්බන්ධ වන සාකච්ඡා සඳහා මෙම ඉල්ලීම යොමු කර ඇති බවත්ය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් සෞඛ්‍ය කම්කරු තනතුර සභාවේ අනුමත කාර්යය මණ්ඩය තුළ නැත්ද යන්නත් එම තනතුර දරන සේවකයන් යොදවා කසළ කළමණාකරණ කටයුතු සඳහා යොදවා ගැනීම ආයතනයේ පරිපාලනයේ කාර්යභාර්ය බවත්, ඉහත පරිදි කසළ කළමණාකරණ කටයුතු වෙනුවෙන් නැවතත් මුදලක් වියදම් කරන්නේ ඇයිදැයි යන්නත් ප්‍රශ්න කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ එතුමා දක්වන පරිදි පසුගිය රජයෙන් බඳවා ගන්නා ලද රැකියා ලක්ෂයේ සේවකයන් නියමිත තනතුරේ පිහිටුවීමේදී ගැටළු රාශියකට මුහුණදීමට සිදුව ඇති බවත් එම සේවකයන් සහ දැනට සභාවේ සෞඛ්‍ය කම්කරුවන් ලෙස ස්ථිර පත්වීම් ලද සේවකයන් විවිධ සේවා අවශ්‍යතා මත තනතුරෙන් පරිභාහිර රාජකාරි සිදු කරන බවත්ය.

අනතුරුව පසුගිය රජයෙන් බඳවා ගන්නා ලද රැකියා ලක්ෂයෙන් පත්වීම් ලද පිරිස විධිමත් ලෙස වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුවක් ලබා දී පළාත් සභාවේ අනුමත කර NVQ O/L මට්ටම දක්වා පුහුණු කර බඳවා ගෙන ඇති බවත් ඒ අනුව එම පිරිස රැකියා ලක්ෂය නොව අනුමත කාර්යය මණ්ඩලයට පළාත් සභාව ඇතුළත් කර ඇති බවත්, රාජකාරියක් භාර දී ඇතිනම් සේවකයන් අනිවාර්යෙන්ම එය කළ යුතු බවත් බලන්ගොඩ නගර සභාවේ අනුමත කාර්යය මණ්ඩලය තුළ සෞඛ්‍ය කම්කරුවන් හා මාර්ග කම්කරුවන් ලෙස බඳවා ගෙන තිබියදී නැවතත් මෙලෙස වැටුප් ගෙවීම තුළින් මහජන මුදල් නාස්තියක් සිදු වන බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ එම සෞඛ්‍ය කම්කරුවන් තිදෙනෙකු බැංකියවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ පොලිතීන් තේරීමේ කාර්යයට යොදවා ඇති බවත් එම සේවකයන් පවරා ඇති රාජකාරී සිදු කිරීමට නොහැකි බව පැවසීමට පැමිණි බවත් ඒ අනුව එම සේවකයන් වෙත අදාළ තනතුරේ රාජකාරී කිරීමට

සිදු වන බවත් එසේ නොමැතිනම් සුදුසු ස්ථානයකට මාරුවීමක් ලබාගෙන යාමට හැකි බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා, එම රැකියා ලක්ෂයෙන් බඳවා ගන්නා ලද සෞඛ්‍ය කම්කරුවන් පමණක් ඉලක්ක කර නොගන්නා ලෙසත් සභාවේ සියළු සෞඛ්‍ය කම්කරුවන් එම ස්ථානයට යොදවන ලෙසත් පවසන ලදී.

ඊට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා මෙම අදහස් වලට එකඟවන බවත්, සභාවේ විවිධ සේවාවන්හි සේවා අවශ්‍යතා මත සහ සේවකයන්ගේ හැකියාවන් මත සෞඛ්‍ය කම්කරු ලෙස බඳවාගත්තද රියදුරු,ගිනි නිවන රාජකාරී ආදියෙහි සේවාවේ යොදවා ඇති බවත් රියදුරු පුරප්පාඩු 04 ක් පමණ පවතින බැවින් එම රාජකාරී සිදු කර ගන්නේ එලෙස යෙදෙවා ඇති සෞඛ්‍ය කම්කරුවන්ගෙන් බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ සී. චන්දන මැතිතුමා පැවසූයේ කසළ ටෙන්ඩර්කරුට මුදල් ගෙවීම මාතෘකාව පිළිබඳව මෙම දීර්ඝ සාකච්ඡාව ඇති වූ බවත් කසළ කළමණාකරණය පිළිබඳව දීර්ඝව පරිසර හා ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කාරක සභාවේදී සාකච්ඡා කිරීම සුදුසු බවත් නොමැතිනම් සභාවේ කාලය නාස්ති වන බවත්ය.ඒ අනුව සභාව ඊට එකඟ විය.

**06:01:16** මාධ්‍යවේදී දීමනාව ගෙවීම හා මුදල තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ඉහත යෝජනාවට අදහස් දක්වමින් මාධ්‍යවේදී දීමනාව රු.1200 ක් විය යුතු බවට යෝජනා කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසූයේ එය රු.1500 ක් විය යුතු බවත් කලින් සභාවන්හි සිට පැමිණි මාධ්‍යවේදීන් වෙත ගෙවීම් කිරීම සුදුසු බවත්ය.

ඒ අනුව සභාවේ එකඟතාවය පරිදි මාධ්‍යවේදී දීමනාව එක් අයෙකුට එක් සභා වාරයකට පැමිණීමේදී රු.1500 බැගින් උපරිම මාධ්‍යවේදීන් 05 දෙනෙකු වෙනුවෙන් ගෙවීම් කිරීම සුදුසු බවත් සභා වාරයක් සඳහා මාධ්‍යවේදීන් 05 දෙනෙකුට වැඩි ප්‍රමාණයක් සහභාගී වන අවස්ථාවකදී උපරිම ගෙවනු ලබන රු.7500 මුදල බෙදා ගෙවීම් කිරීම සුදුසු බවත් සභාපති අරමුදලින් ගෙවීම් කිරීම වෙනුවෙන් මන්ත්‍රී දීමනාවෙන් රු.500 බැගින් සභාපති අරමුදල වෙත බැර කිරීමටත් යෝජනා කරන ලදී.

අනතුරුව ඉහත සඳහන් සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:01:01** තුරු සෙවණ අසල හෙළ බොජුන් හලක් ඉදිකිරීම.

**07:01:02** දුෂ්කර මාර්ගවල ගමන් කල හැකි කසල එකතු කිරීම සඳහා තට්ටුව සහිත ඩීසල් ත්‍රීරෝද රථයක් මිලදී ගැනීම.

**07:01:03** නගර සභා පෙර පාසල ඉංග්‍රීසි ජාත්‍යන්තර පෙර පාසලක් බවට උසස් කිරීම.

**07:01:04** මුගුණමලය මාර්ගය ශෛලතලාරාමය දක්වා නඩත්තු කිරීම.

**07:01:05** ඉත්තගලහේන මාර්ගයේ මුල් කොටස නඩත්තු කිරීම.

**07:01:06** බුද්ධ ජයන්ති මාර්ගයේ මුල් කොටස නඩත්තු කීරීම.

**07:01:07** මුගුණමලේ පාර 2 පටුමග දෙපස නඩත්තු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් සභාවට යෝජනා කර ඇති ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත යෝජනා අංක 07:01:01 සහ 07:01:02 යන යෝජනා ගරු සභාපතිතුමන්ගේ යෝජනා වල අන්තර්ගත වූ බවත්ය. අනතුරුව ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ඉහත යෝජනා ස්ථිර කරන ලදී.

පසුව ඉහත යෝජනා පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පැහැදිලි කරමින් කසළ ඉවත් කිරීමට දුෂ්කර මාර්ගවල ගමන් කිරීමට ත්‍රීරෝද රථයක් මිලදී ගැනීම අත්‍යවශ්‍ය බවත්, බළන්ගොඩ නගර සභා පෙර පාසලට දරුවන් 60 දෙනෙකු පමණ ඇතුළත් කර ගන්නා බවත්, 40,000 කට ආසන්න නාගරික ජනතාවක් බළන්ගොඩ නගරයේ ජීවත් වන බවත්, මෙම දරුවන් 60 දෙනාට වැඩිදියුණු කර පෙර පාසල් පහසුකම ලබා දිය යුතු බවත්, සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමෙන් ඉංග්‍රීසි අධ්‍යාපනය මඟ හැරීමෙන් විශාල පාඩුවක් සිදු වී ඇති බවත්, නගරයේ මධ්‍යම පාන්තික ජනතාව සහ ඉහළ ආදායම් ලබන ජනතාව නගරයේ පවතින ජාත්‍යන්තර පාසල් වලට දරුවන් ඇතුළත් කරන බවත්, එබැවින් දෛනික වැටුප් ගෙවා ගුරුවරුන් බඳවාගෙන ජාත්‍යන්තර පෙර පාසලක් ලෙස උසස් කළ යුතු බවට තමන් යෝජනා කරන බවත්, පවසන ලදී.

තව දුරටත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත යෝජනා පිළිබඳව තම අදහස් දක්වමින් මුගුණමලය සිට ශෛලතලාරාම මාර්ගය නගරය අධික තදබදයක් ඇති වූ විට භාවිතා කරන බවත්, එම මාර්ගය මේ වන විට යාමට නොහැකි ඉතාම අබලන් තත්වයේ පවතින බවත් එම නඩත්තුව ඉටු කර දෙන ලෙසත්, ඉත්තැගලහේන මාර්ගය සම්පූර්ණ අවධානම් සහිත කඳු සහිත මාර්ගයක් බවත් එම මාර්ගය හරහා වැසි ජලය ගලා බසින බැවින් බෝක්කුවක් යොදා පිළිසකර කර දෙන ලෙසත් එම මාර්ගයට පහළින් පෞද්ගලික පන්ති පවත්වන ආයතනය අසළ ඇති බෝක්කුවට සම්බන්ධ කිරීම සුදුසු බවට යෝජනා කරන බවත්, බුද්ධ ජයන්ති මාර්ගයේ ළමුන් දහස් ගණනක් ගමන් කරන මාර්ගයක් බවත්, කිහිප වතාවක් මෙම මාර්ගය සුද්ද කර දෙන ලෙස ඉල්ලීම් සිදු කළද එය මෙතෙක් ඉටු වී නොමැති බවත්, එම මාර්ගයේ වැසි ජලය නිසි පරිදි ගලා යාමට හැකි පරිදි ආනතියකින් යුතුව සංවර්ධන කටයුතු සිදු කර දෙන ලෙසත්, මුගුණමලේ පාර 2 පටුමග දැනට ඉන්ටර්ලොකින් ගල් අල්ලා ඇති මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් යොදා සකස් කර දෙන ලෙසත් යෝජනා කරන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රීනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:02:01** අනදමෙත්ගම 1 පටුමග නො.49 නිවස දක්වා මාර්ගය නඩත්තු කිරීම

**07:02:02** අනදමෙත්ගම බණ්ඩාරවත්ත ලේකම් මහතාගේ නිවෙස් වලට යන මාර්ගය නඩත්තු කිරීම

**07:02:03** ඉත්තගලහේන ඩෙස්මන් මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ එකතු වන ජලය විධිමත්ව බැසයාමට කටයුතු කිරීම.

**07:02:04** ගලපල්ලෙඅරාව රාළහාමි මහතාගේ නිවස අසල මාර්ගය නඩත්තු කිරීම.

**07:02:05** සූර්ය පැනල විදුලි ආලෝක කුළුණු 20 ක් ලබා ගැනීම.

**07:02:06** බණ්ඩාරවත්ත ලේකම් මහතාගේ නිවෙස් වලට යන මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.

**07:02:07** නොදිරන කසළ එකතු කිරීමේ ට්‍රැක්ටර් රථය සතියකට එක් දිනක් ශෛලතලාරාම මාර්ගයේ ඉහළ කොටස දක්වා ගමන් කිරීම.

**07:02:08** වැලිහරනාව මාර්ගයේ නගර සභා සීමාව දක්වා සහ තොසිල ගාර්ඩන් වෙත කසළ එකතු කිරීමේ රථය යෙදවීම.

**07:02:09** මුගුණමලය සහ බස් නැවතුම්පොළ සම්බන්ධවන පාලම සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ඉහත යෝජනා පිළිබඳව පැහැදිලි කරමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා, අනදමෙත්ගම 1 පටුමග නො.49 නිවස දක්වා මාර්ගය ජල සම්පාදන මණ්ඩලයට අසලින් ඇති මාර්ගය බවත්, වර්ෂ ගණනාවකින් නඩත්තු වී නොමැති බවත්, අනදමෙත්ගම බණ්ඩාරවත්ත ලේකම් මහතාගේ නිවෙස් වලට යන මාර්ගයේ ටික දුරක් සංවර්ධන කටයුතු සිදු කර ඇති බවත්, පාර හරහා ඇති බෝක්කුවෙන් වැසි ජලය උතුරා ගොස් පහළින් ඇති නිවෙස් යට වන බවත්, ජේ.සී.බී රථය යොදවා ජලය ගලා බසින ආකාරයට සකස් කිරීම සුදුසු බවට යෝජනා කරන බවත්, ශෛලතලාරාම මාර්ගයේ දිරන කසළ පිළිබඳ ජනතාවට ඉඩකඩ ඇති බැවින් ගැටළුවක් නොමැති බවත් නොදිරන කසළ එකතු කිරීමට ට්‍රැක්ටර් රථය සතියකට එක් දිනක් ශෛලතලාරාම මාර්ගයේ ඉහළ කොටස දක්වා ගමන් කිරීමට යෝජනා කරන බවත්, වැලිහරනාව මාර්ගයේ නගර සභා සීමාව දක්වා සහ තොසිල ගාර්ඩන් වෙත කසළ එකතු කිරීමේ රථය යෙදවීම සිදු කරන ලෙසත් එසේ සිදු කරන තෙක් ටිපර් රථය හෝ යොදවා කසළ ලබා ගන්නා ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:03:01** මොහාන් සාලිය එල්ලාවල මාවතේ ඇති ජල උල්පතෙන් පොළ භූමියට ජලය සපයා ගැනීම සහ ඒ හරහා ටැංකියක් බැද වතුර මෝටරයක් මාර්ගයෙන් බස්නැවතුම්පලේ වැසිකිළි පද්ධතියට ජලය ලබාගැනීම.

**07:03:02** නගරයේ ඇති සියලුම කුලී ත්‍රීරෝද රථ ලියාපදිංචිකොට නිසිආකාරව ස්ථානගත කිරීම සහ නගරයට පැමිණෙන වාහන නවතා තැබීමට ස්ථාන කිහිපයක් නම් කිරීම.

**07:03:03** බළන්ගොඩ නගරය දියුණු කිරීමේ පරමාර්ථය උදෙසා සියළුම ව්‍යාපාරිකයින් හා ව්‍යාපාර වල නිරත වන ප්‍රධාන පෙලේ කණ්ඩායම් රැස්කොට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය, ඉහත ඉදිරිපත් කර ඇති 07:03:01 යෝජනාව කිහිප වතාවක් සභාවට ඉදිරිපත් කර ඇති බවත්, ජලය ඇති කාලවලට පමණක් හෝ එම මොහාන් සාලිය එල්ලාවල මාවතේ ඇති ජල උල්පතෙන් පොළ භූමියට ජලය සපයා ගැනීමේ කාර්යය සිදු කිරීමට යෝජනා කරන බවත් ,නගරයේ ත්‍රීරෝද රථ විශාල ප්‍රමාණයක් නිකරුනේ නවත්වා තිබෙනු දැක ඇති බවත්, නගරයේ ඇති සියලුම කුලී ත්‍රීරෝද රථ ලියාපදිංචිකොට නිසියාකාරව ස්ථානගත කිරීම මඟින් සභාවට ආදායමක් ලබා ගත හැකි බවත්, කොළඹ මහ නගර සභාවේනම් නගරයේ විනාඩි 10ක් පමණ වාහන නවත්වා තැබුවහොත් පමණක් ටිකට් පතක් නිකුත් කරන බවත්, මෙම නගරයේ එසේ නොමැති බවත් රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම විධිමත් කළ යුතු බවත්, බළන්ගොඩ නගරයේ විශාල අඩුපාඩුවක්ව පවතින රථගාලක් ඉදිකිරීම සිදු කරන ලෙසත්, නගරයේ අඩුපාඩු පිළිබඳව හොඳීන්ම දන්නේ නගරයේ ව්‍යාපාරවල නිරත වන අය බැවින් මාස 03 කට හෝ 06 කට වරක් ප්‍රධාන පෙලේ කණ්ඩායම් රැස්කොට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සිදු කිරීමට යෝජනා කරන බවත් පැවසීය.

**07:04 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

**07:04:01** නගරය සතු අවහිර වී ඇති ගිනි කවුළු විවර කිරීම සඳහා කටයුතු කිරීම.

**07:04:02** දැනට වෙන්කරන ලද පොලිතීන් ඇසිරීම සඳහා යොදා ගන්නා පී.එම්.කේ.හාඩ්වෙයාර් ඉදිරිපස ගල්වල නගර සභාව විසින් පාලනය වන ස්ට්‍රීට් ෆුඩ් වෙළඳ කුටි ස්ථාපිත කරගැනීම සඳහා යොදා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා තම අදහස් දක්වමින්, ඉදිරිපත් කර ඇති යෝජනා අංක 07:04:01 හි සඳහන් නගරය තුළ ඇති ගිනි කවුළු විවෘත කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලද්දේ නගරයේ පවත්නා අධික වාහන තදබදය අවම කිරීමට පිළියමක් වශයෙන් බවත්, ප්‍රධාන වශයෙන් කෙලින් වීදියේ ඇති කෝවිල අසළ ගිනි කවුළුව ,මුස්ලිම් පල්ලිය අසළ ගිනි කවුළුව, ලක්මිණි වයින් ස්ටෝර්ස් අසළ ගිනි කවුළුව

අවහිර වීම නිසා ක්‍රීඩා පිටියට පොළට යාමට නොහැකි වී ඇති බවත්, එමෙන්ම එහි අධික දුර්ගන්ධයක් පවතින අතර එය පිරිසිදු කර මගී පහසුව සැලසීම කල යුතු බවත්, ක්‍රීඩා පිටිය පිටුපස රථ වාහන ගාල් කර මෙම කවුළු භාවිතා කිරීම තුළින් මගීන්ට මෙන්ම ව්‍යාපාරිකයන්ටද පහසුවක් වන බවත්,

යෝජනා අංක 07:04:02 මඟින් දැනට වෙන් කරන ලද පොලිතීන් ඇසිරීම සඳහා යොදා ගන්නා PMK හාඩ්වෙයාර් ඉදිරිපස ගල්වල අසළ ඉඩමේ නගර සභාව විසින් පාලනය වන STREET FOOD වෙළඳ කුටි ස්ථාපිත කිරීම සුදුසු බවත් ඒ තුළින් නොනිදන නගරයක් සංකල්පය ක්‍රියාත්මක කළ හැකි බවත්, සභාවේ ආදායම් ඉහළ යාමත් නගරයට ආකර්ශනීය බවක් ඇති වීමත් සංචාරක ප්‍රවර්ධනය සඳහා ඉවහල් වීමත් ජනතාවගේ මානසික පීඩනය අවම වීම යන ප්‍රතිලාභ ලැබෙන බවත් පවසන ලදී.

ඉහත යෝජනාවෙන් දක්වා ඇති ස්ථානයේ දක්වා ඇති පරිදි වෙළඳ කුටි සඳහා ලබා දිය හැකිද යන්න පිළිබඳව කරුණු සාකච්ඡා කිරීම පිණිස ගරු සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන්ගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

කාරක සභාවේ සාකච්ඡා කරන ලද කරුණු අනුව ගල්වල සහිත ඉඩම අවධානම් කලාපයක් බැවින් එම ස්ථානයේ ඉදිකිරීම් කිරීමේ හැකියාවක් නොමැති බැවින් ඊට ඉදිරිපිට PMK හාඩ්වෙයාර් අසළ සභාවට අයත් ඉඩම් කොටස භාවිතා කළ හැකි බවට සභාව එකඟ විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා**

**07:05:01** නගරයට පැමිණෙන මගීන්ට අවහිරයක් වන ආකාරයට පවතින පදික වෙළඳාම ඉවත් කර ඔවුනට පවතින පොදු වෙළඳසැල තුළ කටයුතු කිරීමට පෙළඹවීම කලයුතු බව යෝජනා කරමි.

**07:05:02** නගර සභාව සතු දැන්වීම් පුවරු පිළිසකර කිරීම සහ ක්‍රමවත්ව පවත්වාගෙන යාමට කටයුතු කිරීම මෙන්ම පෝස්ටර් ඇලවීම සඳහා හඳුනාගත් නිශ්චිත ස්ථාන වෙන්කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපතිතුමන් විසින් ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමා වෙත ප.ව.1.55 ට පමණ මූලාසනය භාර දෙන ලදී.**

ඉහත යෝජනා පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා, නගරයට පැමිණෙන අයෙකුට  කොමර්ෂල් බැංකුව අසළ පදික වෙළඳාම ඉතාම අප්‍රසන්න බවක් එකතු කරන බවත් දැන් එය නගරයට පිටින් වෙළඳුන් පැමිණත් සිදු කරන බවත්, මෙය විධිමත් කර පොදු වෙළඳසැළ භූමිය වෙත රැගෙන යාම මඟින් වෙළඳුන්ටද අසාධාරණයක් නොවන බවත්, වසර ගණනාවක සිට සභාව වෙත කඩ කුලී ගෙවන කඩ හිමියන් වෙතද ඒ තුළින් සාධාරණයක් ඉටු වන බවත්, මෙම පදික වේදිකාවේ වෙළඳාම් කරන වෙළඳුන්ගේ නමින් පදික කඩ කාමර පවත්නා බවත් එම කඩ කාමර කුලියට ලබා දී මෙලෙස පදික වෙළඳාමේ වෙළඳාම් සිදු කරන බවත්, මෙම ගැටළුව පිළිබඳව සභාවේ සියලු සභිකයන් එක්ව තීරණයක් ගත යුතු බවත්,

යෝජනා අංක 07:05:02 න් දක්වා ඇති පරිදි නගරයේ පෝස්ටර් ඇලවීම තහනම් කළ යුතු බවත් හඳුනාගත් නිශ්චිත ස්ථාන වෙන් කර ලබා දී ගාස්තු අය කිරීමක් සිදු  කිරීම සුදුසු බවටත් යෝජනා කරන බවත් පැවසීය.

**ගරු උප සභාපති පේෂල ටී.ජයසේන මැතිතුමා විසින් ගරු සභාපතිතුමන් වෙත ප.ව.2.00 ට පමණ මූලාසනය භාර දෙන ලදී.**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය තම අදහස් දක්වමින් බළන්ගොඩ නගරයේ පෞද්ගලික පන්ති පවත්වන ගුරුවරුන් ගෙන්වා ඉහත කාරණය පිළිබඳව දැනුවත් කිරීම සුදුසු බවට පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා නැවතත් තම අදහස් දක්වමින් පැවසූයේ බළන්ගොඩ නගර සභාව කාර්යසාධන තරග වලින් පළමු ස්ථානය ලබා ගත්තද, එදිනට පමණක් පදික වෙළඳාම ඉවත් කර ලකුණු ලබා ගැනීම නොව විය යුත්තේ  මෙම ගැටළුවට ස්ථිරවම විසඳුම් සෙවීම බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ කලින් සභා වාරයේදීත් පදික වෙළඳාම පිළිබඳව මෙවන් ගැටළු මතු වූ බවත් එහිදී විසඳුමක් ලෙස පදික කඩ 29ක්  ඉදිකර ලබා දුන් බවත්, නමුත් එම කඩ පෙළින් කඩ 05 හෝ 06ක් පමණක් විවෘතව පවතින බවත් එම කඩ කාමර ස්ටෝර්ස් ලෙස භාවිතා කරමින් පදික වෙළඳුන් පදික වෙළඳාමේ යෙදෙන බවත්, එසේ කරන්නේ නම් එම කඩ කාමර සභාව වෙත පවරා ගැනීම සිදු කළ යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ එම පදික කඩ කාමර ලබා දී ඇති වෙළඳුන් පිළිබඳ ලයිස්තුවක් ලබා ගෙන ඉදිරි කටයුතු සලකා බැලිය යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, පදික වෙළඳුන් වෙත මෙලෙස ලබා දුන් කඩ කාමරවල ඉඩකඩ ඉතාම සීමිත බවත්, එය සාධාරණයක්  වන ලෙස කඩ කාමර 02 ක් එක් අයෙකුට ලබා දීම වැනි සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවත්, පදික වෙළඳාම සම්පූර්ණයෙන් ඉවත් කිරීමට තමන් විරුද්ධ බවත්, පදික කඩ ලබා ගෙන ඇති කඩ හිමියන් පදික වෙළඳාමේ නිරත වනවානම් එයට විරුද්ධ බවත්, දෛනිකව යම්කිසි රැකියාවක් කර ජීවත් වන මිනිසුන් පදික වෙළඳාමේ නිරත වන අවස්ථා වලදී එය අසාධාරණ බවත්,  ලෝක වෙළඳපලේ පවා පදික වෙළඳාමට අවස්ථාව ලබා දී ඇති බවත්, විධිමත් ලෙස ගැටළුව විසඳීම සිදු කළ යුතු බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා නැවතත් තම අදහස් දක්වමින් පැවසූයේ , කොමර්ෂල් බැංකුව අසළ පදික වෙළඳාම මහා මාර්ගය දක්වාම පැමිණ ඇති බවත් වාහනයක් පාරේ යාමටවත් නොහැකි තත්වයට පත්ව ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පවසනවා සේම එම වෙළඳුන්ට අසාධාරණයක් නොවන පරිදි පදික වෙළඳාම වෙනුවෙන් සුදුසු ස්ථානයක් ලබා දීමට තමන් විරුද්ධ නොවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා තම අදහස් දක්වමින් පදික වෙළඳාම බලන්ගොඩ නගරයේ හැම තැනකම දැකිය හැකි බවත්, එම වෙළඳුන් අවුරුදු 25,30 පදික වෙළඳාමේ නිරත වූ වෙළඳුන් බවත්, නගර සභාව මගින් පදික කඩ කාමර ලබා දීමේදී සමහර වෙළෙන්දන්ට කඩ කාමර නොලැබුන බවත්, කඩ හෝ ස්ථානයක් ලබා දෙන්නේ නම් අසාධාරණයක් නොවන පරිදි ලබා දිය යුතු බවත් ,තමන් දන්නා තරමින් යම් යම් පුද්ගලයන් නගරයේ මහ පොළොව මුදල් වලට විකිණෙනු ලබන බවත්, මෙම යෝජනාව කාලෝචිත ක්‍රියාවක් බවත් නමුත් ඥානාන්විතව ගැටළුව විසඳීම සිදු කළ යුතු බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ පදික වෙළඳාම හේතුවෙන් මහජන පොළ ඇතුළත කඩ කාමර වෙළඳුන් වෙළඳාම නොමැති බව පවසන බවත්, එම අයද පදික වෙළඳාමට පැමිණෙන බව පවසන බවත්, වෙළඳුන් සමඟ සාකච්ඡා කර පොළ භූමිය තුළට ගෙන යාම සහ පදික කඩ ලබා දී ඇති වෙළෙන්දන් එම කඩ කාමර වෙත යැවීම වැනි පොදු තීරණයක් ගැනීම සුදුසු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසූයේ මෙතෙක් සියල්ලන්ම සාකච්ඡා කලේ කොමර්ෂල් බැංකුව අසළ පදික වෙළඳාම පිළිබඳව පමණක් බවත්, පදික වෙළඳාම එම ස්ථානයේ පමණක් නොව නගරය පුරාම පවතින බවත්, පදික වෙළඳාම පිළිබඳ තීරණයක් ගන්නේ නම් සියළු දෙනාටම පොදු විය යුතු බවත්, ප්‍රායෝගිකව මෙම තීරණ ක්‍රියාත්මක කරන ලෙසද, වැඩ කිරීමට බාධාවක් නොකරන බවත්, අවශ්‍ය සහයෝගය ලබා දෙන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා තමන් නියෝජනය කරන කොට්ඨාශයේ විශාල පිරිසක්ද පදික වෙළඳාමේ නිරත වන බවද, පසුගිය කාල සීමාවේදී පදික කඩ ලබා දීමේදී අසාධාරණයට ලක් වූ පිරිසක් සිටින බවද, පාරිභෝගිකයාගේ පාර්ශවයෙන් වඩා සාධාරණ මුදලකට පදික වේදිකාවේ ඇතැම් භාණ්ඩ අලෙවි වන බවද, මෙම ගැටළුව විසඳීමට ප්‍රවිශ්ඨ වීමේදී ගනු ලබන ක්‍රියාමාර්ග වලට අවශ්‍ය සහයෝගය ලබා දෙනු ලබන බවද, වෙළෙන්දන්ට අසාධාරණයක් නොවන පරිදි එම ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙසද තම අදහස් දක්වමින් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා**

**07:06:01** බලන්ගොඩ නගර සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ එහි සියලු ටෙන්ඩර් කැඳවීම් ඉදිරි වැඩ සටහන් ඇතුළත් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

**07:06:02** ළමා උද්‍යානයේ විශාල අඩුවක්ව පවතින ක්‍රීඩා උපකරණ විනාශ වීම යාවත්කාලීන කිරීම , නව ඉදිකිරීම් කඩිනම් කිරීම සතියකට වරක් වත් සේවකයෙක් යොදා නඩත්තු කිරීමට කටයුතු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා පැවසූයේ දැනට ලංකාවේ පවතින හොඳම වෙබ් අඩවිය වන කොළඹ මහ නගර සභාවේ වෙබ් අඩවිය ආදර්ශයට ගෙන බලන්ගොඩ නගර සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන කළ යුතු බවත්, බලන්ගොඩ නගර සභා ළමා උද්‍යානයේ පවත්නා සෙල්ලම් උපකරණ අවුරුදු 12 ක් පමණ පැරණි බවත් ඉන් උපකරණ බොහෝ ප්‍රමාණයක් මේ වන විට කැඩී බිඳී ගොස් ඇති බවත් කඩිනමින් එම උපකරණ අලුත්වැඩියාව සිදු කළ යුතු බවත් යෝජනා කරන බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

**07:07:01** නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීමට සමගාමීව පහන් කණු සුදු තීන්ත යොදා ඇස් මට්ටම දක්වා ආලේප කිරීම සහ පහන් කණු සඳහා සෝලා පද්ධතියක් භාවිතා කර විදුලි බිල අඩු කරගැනිම කඩිනම් පියවරක් ලෙස ප්‍රධාන බස්නැවතුම්පල පිටුපස ඇති බස්නැවතුම අසල පහන් කණු ආලෝකමත් කිරීම, මේ සඳහා සියළුම සභිකයන්, මාර්ග සංවර්ධන අධිකාරිය, සිවිල් සංවිධාන , වෙළඳ ප්‍රජාව සම්බන්ධ කරගැනීම සහ දිනයක් යෝජනා කරගැනීම , මෙය මාස 02 කට වරක් හෝ අඛණ්ඩව සිදුකිරීම කළ යුතු බවට යෝජනා කරමි.

**07:07:01** නගරයේ සියළුම ආපන ශාලා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ලවා පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සහ ඒ සඳහා දිනයක් යොදා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ රු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා, පහන් කණු සුදු තීන්ත යොදා ඇස් මට්ටම දක්වා ආලේප කිරීම මඟින් රාත්‍රී කාලයේදී සිදුවන මාර්ග අනතුරු සිදු වීම අවම වන බවත්, දියුණු රටවල එවැනි ක්‍රම භාවිතා කරන බවත්, පහන් කණු සඳහා සෝලා පද්ධතියක් භාවිතා කර විදුලි බිල අඩු කරගැනිමේ හැකියාවක් පවතින බවත්, නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීම සඳහා දිනයක් යොදාගෙන සියළුම සභිකයන්, මාර්ග සංවර්ධන අධිකාරිය, සිවිල් සංවිධාන , වෙළඳ ප්‍රජාව සම්බන්ධ කරගැනීම සිදු කළ යුතු බවත්, නගරයේ සියළුම ආපන ශාලා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු ලවා පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම සහ ඒ සඳහා දිනයක් යොදා ගැනීම සුදුසු බවත් යෝජනා කරන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:08 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:08:01** ඇවිදින මං තීරුවේ අඩුපාඩු සොයා බලා සම්පූර්ණ කරදීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා**

**07:09:01** තුඹගොඩ කොට්ඨාශයේ සදුන්ගම ප්‍රදේශයට ජලය නිසි ආකාරයෙන් නොලැබීම සම්බන්ධව ජල සම්පාදන මණ්ඩලය සමග සාකච්ඡා කර අවශ්‍ය ජලය ලබාගැනීමට ප්‍රදේශවාසීන්ට සැලසීම හා බලන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඇතුළත් කිරීම.

**07:09:02** එම ප්‍රදේශයේ ජීවත්වන ප්‍රදේශවාසීන්ට එල්.ආර්.සී.ඔප්පු ලබාදීමට යෝජනා කිරීම හා බලන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඇතුළත් කිරීම.

**07:09:03** සඳුන්ගම හා බැංකියවත්ත මාර්ග දෙක කාපට් කිරීමේ යෝජනාව අනුමත කර බලන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඇතුළත් කිරීම.

**07:09:04** සඳුන්ගම පොදු ප්‍රජා ශාලාවක් ඉදිකිරීම.

**07:09:05** මන්ත්‍රීවරුන් සඳහා නිශ්චිත පැය ගණනක් සඳහා ජේ.සී.බී රථය ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසූයේ 07:09:01, 07:09:02 ,07:09:03 යන යෝජනා ඉදිරිපත් කර ඇත්තේ ඒ සඳහා සභා සම්මුතිය ලබා ගෙන බලන්ගොඩ සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඇතුළත් කිරීමට බවත්, සඳුන්ගම පොදු ප්‍රජා ශාලාවක් ඉදිකිරීමේ යෝජනාව ඉදිරියේදී මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු සංවර්ධන යෝජනාවක් ලෙස සලකා බලන ලෙසත්, මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති සිදු කිරීමට ජේ.සී.බී රථය ලබා දීමට කටයුතු කරන ලෙසත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ පොදු අවශ්‍යතා වෙනුවෙන් ජේ.සී.බී රථය ලබා දිය හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසා සිටයේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා ඉදිරිපත් කර ඇති 07:09:05 යෝජනාව ඉතාම කාලෝචිත බවත්, කර්මාන්ත කමිටුව හරහා ලබා දිය හැකි පැය ගණන පිළිබඳ තීරණය කළ හැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, යෝජනාවක් ලබා දුන් පසු කාර්මික නිලධාරී ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලබා දෙන ඇස්තමේන්තු මත ජේ.සී.බී රථය ලබා දෙන ලෙසත් යෝජනා කරන බව

පවසන ලදී. ගරු සභාපතිතුමා පැවසුයේ එවැනි ඇස්තමේන්තුවක් මත පොදු අවශ්‍යතා වෙනුවෙන් ජේ.සී.බී රථය ලබා දීම සුදුසු බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10 ගරු උපසභාපති පේසල ටී ජයසේන මැතිතුමා**

**07:10:01** ඕලුගන්තොට ශ්‍රී ගංගාරාම විහාරස්ථානයේ පිවිසුම් තොරණ අසල සිට ඇල්ලෙඅරාව මංසන්ධිය දක්වා ප්‍රධාන මාර්ගය විථි පහන් ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. එම ස්ථානයේ විශාල විවෘත අවකාශයක් පවතින බැවින් සහ නිතර රෝහලට පැමිණෙන ජනතාව ගැවසෙන බැවින්, රෝහල ඉදිරිපිට සහ දෙපස දැනට පවතින විථි පහන් සඳහා වැඩි තීව්‍රතාවයකින් යුත් එල්.ඊ.ඩී බල්බ 10 ක් සවිකිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු උපසභාපති පේසල ටී.ජයසේන මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාවේ විදුලි බල්බ පිළිබඳ ගබඩාවේ ඇති ප්‍රමාණය යනාදී කරුණු පිළිබඳ ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:11 ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා**

**07:11:01** පසුගිය දිනවල පැවති අධික වර්ෂාව නිසා කිරිදිගල රබර්වත්ත පාර අසලින් පහළට බහින පාර තාර යොදා සංවර්ධනය කිරීම.

**07:11:02** ඇල්ලෙඅරාව එක්සත් මාවත සංවර්ධනය කිරීම.

**07:11:03** කරදියමුල්ල ගමගෙදර පාර සංවර්ධනය කිරීම.

**07:11:04** පුරණ ගෙදර පාර මහේෂ් මහතාගේ නිවෙස් වලට යන පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම.

**07:11:05** කිරිදිගල ජනපද පාර කාණු පද්ධති ඉදිකර මාර්ගය සංවර්ධනය කිරීම.

**07:11:06** ඇල්ලෙඅරාව සරත් මහතාගේ නිවෙස් වලට යන පාර සංවර්ධනය කිරීම.

**07:11:07** පුරණ ගෙදර සම්පත් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:12 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

**07:12:01** පරගහකුඹුර පාර බෝම්බුව පන්සල ළඟ සිට අලුත්වැඩියා කිරීම.

**07:12:02** බෝම්බුව ආචාරිමලේ බර්නාඩ් මහතාගේ නිවෙස්වලට යන පාර අලුත්වැඩියා කිරීම.

**07:12:03** ගල්වල වතුකාරගොඩ මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම.

**07:12:04** බෝම්බුව මිරිස්කොටුව මාර්ගයේ කැඩී ඇති කොන්ක්‍රීට් ලැල්ල දමා මාර්ගය අලුත්වැඩියා කිරීම.

**07:12:05** බළන්ගොඩ කොට්ඨාශයේ සියළුම කාණු ශුද්ධ කිරීම,එළිපෙහෙලි කිරීම හා මාර්ග ශුද්ධ කිරීම.

**07:12:06** බළන්ගොඩ කොට්ඨාශය තුළ මේ වන විට විථි ලාම්පු සෑහෙන ප්‍රමාණයක් දැල්වෙන්නේ නැත. එම විදුලි ලාම්පු අලුත්වැඩියා කිරීම.

**07:12:07** ගල්වල වතුකාරගොඩ මාර්ගයේ අවහිර වන සේ සිටුවා ඇති කම්බි කණු ඉවත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, ඉහත යෝජනා පිළබඳව අභිනවයෙන් පත් වූ කර්මාන්ත කාරක සභාවේ සභාපතිතුමා සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා ගන්නා බවත්, එතුමා පෞද්ගලිකව සභාපතිතුමාට ලබා දුන් වැට සම්බන්ධ පැමිණිල්ල මේ වන තෙක් විසඳී නොමැති බැවින් එම ඉල්ලීම පිළිබඳව සලකා බලන ලෙසත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

අනතුරුව ගරු සභාපතිතුමා විශේෂ යෝජනා කිහිපයක් තිබෙන බවත් මින් ඉදිරියට සභාව වෙත යෝජනා භාර දීමේදී අදාළ කාල සීමාව තුළ භාරදීම අනිවාර්යය බවත් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව සභාපතිතුමා විසින් විශේෂ යෝජනා ලෙස ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් යෝජනා කර භාරදී ඇති පහත යෝජනා සභාවට යෝජනා කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

**07:13 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**07:13:01** බළන්ගොඩ මිරිස්වත්ත කහටපිටිය පාර මුස්තාපා මාවත සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති නිසා මෙම මාර්ගයේ ගමන් කරන මහජනතාව දැඩි අසීරුතාවයට පත්ව ඇති බැවින් මෙම මාර්ගයට ක්‍රොන්ක්‍රීට් හෝ තාර දමා කඩිනමින් අළුත්වැඩියා කිරීම.

**07:13:01** බළන්ගොඩ කහටපිටිය පාර සුබයිර් අලීම් මාවත අබලන් වී ඇති කොටස කඩිනමින් අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:14 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා**

**07:14:01** උඩ ඇල්ලෙපොළ කොට බෝධියට පහළින් මුල්ගෙදර වත්තට යන මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

**07:14:02** බළන්ගොඩ සිට රත්නපුර දිවෙන මාර්ගයේ දෙපස වීථි ලාම්පු සවිකිරීම.

**07:14:03** බළන්ගොඩ රත්නපුර පාර ඇල්ලෙපොළ මහ විද්‍යාලය දක්වා මාර්ගයේ කාණු පද්ධතිය මුළු මනින්ම සුද්ද පවිත්‍ර කළ යුතුව ඇත.විශාල වශයෙන් මදුරු උවදුරට ලක්වන බැවින් සහ කාණුවට ඉවුරු කඩා වැටීම නිසා බොහෝ ස්ථාන වල අවහිර වී ඇත.මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර කාණු ගොඩ දමා ජලය බැසයාමට සැකසීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා රත්නපුර පාරේ විදුලි පහන් කණු සඳහා අලුතින් බල්බය රුඳවීමේ හැඩල සහිත 08 ක් සහ බල්බ 12 ක් පමණ අවශ්‍ය බවත්, සරස්වතී පාර කනත්ත දක්වාද මෙම අවශ්‍යතාවය පවතින බවත්, ඇල්ලෙපොල මාර්ගයේ කාණු පද්ධතිය බොහෝ ස්ථානවල ඉවුරු කඩා වැටී අවහිර වී ඇති බවත්, එක දිගටම කාණු ඉදිකර නොමැති බැවින් මෙලෙස කාණු වලට ඉවුරු කඩා වැටෙන බවත් ,මේ සම්බන්ධව සභාවෙන් විමසූ විට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කළ යුතු බව පැවසූ බවත්, ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියට කාණු ගොඩ දැමීම පිළිබඳව දැනුවත් කරන ලෙසත් යෝජනා කරන බව පැවසීය.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවවේදී මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දීම සුදුසු බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ප.ව 2.38ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

ගරු සභාපතිතුමා පවසා සිටියේ සභිකවරුන් ඉදිරිපත් කර ඇති යෝජනා සියල්ලම පිළිබඳව අවධානය යොමු කරන බවත් , එමෙන්ම ඒ සියල්ලම ක්‍රියාත්මක කිරීමට මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයට සලකා බැලීම සිදු කරන බවත්ය.

**07:15** 2025 ජූලි පෙර පාසල් දීමනා රු.30,000 ක්ද, සුසාන භූමි නඩත්තු දීමනා රු.30,000 ක් ද, ස්ථිර සේවක වැටුප් අත්තිකාරම් රු.9000 ක්ද, දෛනික වැටුප් රු.1,717,478.05 ක්ද ගෙවීම් කිරීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මෙලෙස න්‍යාය පත්‍රයට පිටින් යෝජනා ඉදිරිපත් කළ නොහැකි බවයි. එමෙන්ම මුදල් ගෙවීම් මෙලෙස සිදු කිරීම කළ නොහැකි බවත්, ජූනි මස දෛනික වැටුප් ගෙවීමට අදාළව ජූලි මස මුල යොමුකරන න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට නොහැකි ඇයි දැයි විමසන ලදී.මෙය ආයතනයෙන් සිදු වුනු අඩුපාඩුවක් යැයි ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුවාය.

මේ පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේසල ටී.ජයසේන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව කාරක මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් 2025 පළාත් පාලන මැතිවරනය මඟින් ජයග්‍රහණය කර බළන්ගොඩ සභාව වෙත පැමිණීමට ලැබීම සතුටක් බවත්, 2014 වර්ෂයේදී තමන්ගේ කොට්ඨාශයේ ජනතාව තමන්ව විශ්වාස කරමින් ඡන්දය ලබා දීමෙන් තේරී පත් වූ බවත්, මෙවර 2025 පළාත් පාලන මැතිවරණයේදීද කොට්ඨාශයේ ජනතාව වැඩිම මනාපයකින් ජයග්‍රහණය කරවීම සම්බන්ධව ස්තුතිය පුද කරන බවත්, බළන්ගොඩ නගර සභාවේ ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් හෘද සාක්ෂියට එකඟව හරි දේට හරි කියමින් වැරදි දේට වැරදි කියමින් කටයුතු කරන බවත්, ජාතික ජන බල වේගයේ රජය බලාපොරොත්තු වන්නේද බොහොම වැදගත් වූ නිහතමානී වූ හොර මැර නැති සේවාවක් ලබා දීම බවට තමන් අදහස් කරන බවත්, ඊට සහයෝගය ලබා දෙන බවත්, බළන්ගොඩ නගර සභාවේ පෙර පැවැති වැරදි

සොයා බලන ලෙසත්, බළන්ගොඩ වරිපනම් ගෙවන ජනතාවට සාධාරණයක් ඉටු කරන දෙන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**09. අවසානය**

සභාවේ සියල්ලන්ම නගරයේ පුරවැසියන් සේම මහජනයාගේ ඡන්දයෙන් පත්වූ මහජන නියෝජිතයන් බැවින් එම ජනතාව වෙනුවෙන් උපරිම සේවාවක් ලබා දිය යුතු බවත්, සභාවේ ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දෙන ලෙසත්, අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පලකරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව. 3.02ට පමණ අවසන් කරන ලදී.

කේ. ජී.පේමදාස,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.